# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2010 අංක 11 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 ඔක්තෝබර් මස 05 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2010 ඔක්තෝබර් මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2010 අංක 11 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2010 ඔක්තෝබර් මස 05 වන දින]

එල්.ඩී.—ඕ. 52/2007.

**සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2010 අංක 11 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** ප්‍රධාන ප්‍රඥප්තියේ 338 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 338 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන්, පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ බූදලය රුපියල් මිලියන හතරකට වඩා වටිනාකමින් අඩු වන විට, උරුමය ඇති ළඟම නෑයා අදහස් වේ :
>
> එසේ වුව ද, නීත්‍යානුකූල නියෝජිතයා කවරෙකු ද යන්න සම්බන්ධයෙන් යම් ආරවුලක් පැන නගින අවස්ථාවක 397 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 394 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "නීත්‍යානුකූල නියෝජිතයා" යන යෙදුමේ අර්ථය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 394 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන්, පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ බූදලය රුපියල් මිලියන හතරකට වඩා වටිනාකමින් අඩු වන අවස්ථාවක, උරුමය ඇති ළඟම නෑයා අදහස් වේ.;

ප්‍රධාන ප්‍රඥප්තියේ 524 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 524 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) 529 වන වගන්තිය යටතේ වූ දැන්වීම පළ කිරීමේ වියදම ආවරණය කිරීම සඳහා වූ ගාස්තු ගෙවූ බවට සාක්ෂි පෙත්සම්කරු විසින් පෙත්සම සමග ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 525 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 525 වන වගන්තියේ ඇති "රුපියල් පන්ලක්ෂයක්" යන වචන වෙනුවට "රුපියල් මිලියන හතරක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 527 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 527 වන වගන්තියේ ඇති "රුපියල් පන්ලක්ෂයක්" යන වචන වෙනුවට "රුපියල් මිලියන හතරක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 528 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 528 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එය (ඇ) ඡේදය ලෙස බලාත්මක විය යුතු ය :—

"(ඇ) ඉල්ලීමට කැමැත්ත ප්‍රකාශ කර නැති වගඋත්තරකරුවන්ට එම ඉල්ලීමට යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා 529 වන වගන්තිය යටතේ වූ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන දිනයක දී හෝ එදිනට පෙර ඉදිරිපත් කරන ලෙස එම වගඋත්තරකරුවන්ට නියම කරන දැන්වීම්. එම දැන්වීම් ප්‍රොබේට් නිලධරයා විසින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "පහත දැක්වෙන කරුණුවලට අදාළ තොරතුරු ඇතුළත් කරමින්" යන වචන වෙනුවට "පහත දැක්වෙන කරුණුවලට අදාළව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "දැන්වීම අදාළ වන යම් තැනැත්තකුට" යන වචන වෙනුවට "524 වන වගන්තිය හෝ 528 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක නිශ්චිතව සඳහන් කර ඇති යම් තැනැත්තකුට" යන වචන ආදේශ කිරීමෙන්;

ප්‍රධාන ප්‍රඥප්තියේ 530 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 530 වන වගන්තියේ ඇති "එම දැන්වීමේ නම් කර ඇති" යන වචන වෙනුවට "මියගිය තැනැත්තාගේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 541 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 541 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ උරුමක්කාරභාවය පිළිබඳ සහතිකය සඳහා ඉදිරිපත් කරන ලද මුල් පෙත්සමේ වගඋත්තරකරුවන්" යන වචන වෙනුවට "ඉල්ලීමට විරෝධතා ඉදිරිපත් කර ඇති මියගිය තැනැත්තාගේ උරුමක්කාරයන් හෝ වෙනත් තැනැත්තන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 545 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 545 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතැම් අවස්ථාවල දී කිසිදු දේපළක් පවරනු නොලැබිය යුතු බව.

545. දේපළ පවරනු ලබන දිනයට අවුරුදු පහකට පෙරාතුව වූ කාලය ඇතුළත, අන්තිම කැමති පත්‍රයක් තබා හෝ නොතබා ශ්‍රී ලංකාවේ දී නැතහොත් ඉන් පිටත දී මියගිය යම් තැනැත්තකුගේ බූදලය වටිනාකමින් රුපියල් මිලියන හතරක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන අවස්ථාවක, අන්තිම කැමති පත්‍රයක් තබා මියගිය තැනැත්තකු සම්බන්ධයෙන් වනවිට ප්‍රොබේට් බලපත්‍රය හෝ අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය තැනැත්තකු සම්බන්ධයෙන් වන විට අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර හෝ උරුමය පිළිබඳ සහතික නිකුත් කර ඇත්නම් මිස, අන්තිම කැමති පත්‍රයක් තබා හෝ අන්තිම කැමති පත්‍රයක් නොතබා ශ්‍රී ලංකාවේ දී නැතහොත් ඉන් පිටත දී මියගිය යම් තැනැත්තකුගේ බූදලයට හෝ බඩු බාහිරාදියට අයත් වන හෝ ඊට ඇතුළත් වන ශ්‍රී ලංකාවේ පිහිටි යම් චංචල හෝ නිශ්චල දේපළක් කිසිම තැනැත්තකු විසින් පැවරීමක් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 554 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 554 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (2) වන උපවගන්තියේ සඳහන් "වටිනාකම රුපියල් පන් ලක්ෂයකට වැඩි මුදලයක්" යන වචන වෙනුවට, "වටිනාකම රුපියල් මිලියන හතරකට වැඩි මුදලයක් " ;

(2) එහි (3) වන උපවගන්තියේ සඳහන් "වටිනාකම රුපියල් පන් ලක්ෂයකට අඩු මුදලයක්" යන වචන වෙනුවට, "වටිනාකම රුපියල් මිලියන හතරකට අඩු මුදලයක්. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 82 වන ආකෘති පත්‍රය වෙනුවට පහත දැක්වෙන ආකෘති පත්‍රය ආදේශ කිරීමෙන් :—

"අංක 82

517/524 වන වගන්තිය

**අන්තිම කැමති පත්‍රය ඇමුණූ ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලය සඳහා වූ ඉල්ලීමේ ආකෘතිය**

මියගිය ඒ. බී. ගේ අන්තිම කැමති පත්‍රයෙහි කාරණය සම්බන්ධයෙන්........................................... හි සී. ඩී. පෙත්සම්කරු

1. ...........................හි ඒ. බී. 20... මස ... වන දින මියගියේ ය.

2. එකී ඒ. බී. (දැනට මේ අධිකරණයෙහි තැන්පත් කොට තිබෙන්නා වූ හෝ මේ සමග අමුණන ලද හෝ අවස්ථාවෝචිත පරිදි - 524 වන වගන්තිය බලන්න) 20...... මස......... වන දින දරන ඔහුගේ අන්තිම කැමති පත්‍රය යථා පරිදි ලියා අත්සන් කළේ ය.

3. පෙත්සම්කරුගේ උපරිම දැනුම අනුව මියගිය එකී ඒ. බී. ගේ උරුමක්කාරයෝ නම්.........

4. මියගිය තැනැත්තා තබා ගිය දේපළ පිළිබඳ පෙත්සම්කරුට දැනගත හැකිතාක් සම්පූර්ණ හා සත්‍ය විස්තර මීට යාකොට ඇති උපලේඛනයේ අන්තර්ගත කොට ඇත.

5. පෙත්සම්කරු (අවස්ථාවෝචිත පරිදි පොල්මඃකරු, ණයහිමියා ආදීන්) වශයෙන් හිමිකම් පායි.

එකී අන්තිම කැමති පත්‍රය ඔප්පු කළේ යයි ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් කරන ලෙස ද, එකී අන්තිම කැමති පත්‍රයෙහි පොල්මඃකරු තමා යයි ප්‍රකාශ කරන ලෙස ද, ඒ අනුව එහි ප්‍රොබේට් බලපත්‍රය තමන්ට නිකුත් කරන ලෙස ද (නැතහොත් අන්තිම කැමති පත්‍රයෙහි පිටපතක් අමුණන ලද අද්මිනිස්ත්‍රාසි බල ප්‍රදානයක් ඉල්ලුම් කරන්නේ නම් නිකුත් කරන ලෙස ද) පෙත්සම්කරු යටහත් භාවයෙන් ආයාචනය කරයි. (සීමිත ප්‍රදානයක් ඉල්ලුම් කරන්නේ නම් ඊට සුදුසු ආකාරයක් දක්වන්න.)

(විධිමත් අවසානය)

**උපලේඛනය**

(2 වන හා 5 වන ඡේද දිවුරුම් පත්‍රයකින් හෝ වාචික සාක්ෂිවලින් සනාථ කරන්න. අන්තිම කැමති පත්‍රය ලියූ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත දී මිය ගියේ නම් තනි තෙස්තමේන්තු අධිකරණ බලය දැරීමට අධිකරණය පත්කළ නියෝගයක් ඉල්ලුම්කරු ලබාගෙන ඇති බවට සඳහන් කරන්න.)".

(2) එහි 83 වන ආකෘති පත්‍රය වෙනුවට පහත දැක්වෙන ආකෘති පත්‍රය ආදේශ කිරීමෙන් :—

"අංක 83

(517 වන වගන්තිය)

**අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවක අද්මිනිස්ත්‍රාසි බලය හෝ උරුමය පිළිබඳ සහතිකයක් ඉල්ලීමේ ආකෘතිය**

(විධිමත් කොටස් කලින් තිබුණු ආකෘති පත්‍රය අනුවමය)

මියගිය ඒ. බී. ගේ අන්තිම කැමති පත්‍රයේ කාරණය සම්බන්ධයෙන්................................ හි, සී. ඩී. පෙත්සම්කරු

V

(පෙත්සම්කරුගේ උපරිම දැනුම අනුව මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති බූදලයේ උරුමක්කාරයන් වගඋත්තරකරුවන් ලෙස නම් කරන්න.)

1. ...............හි ඒ. බී. 20...... මස...... දින මියගියේ ය.

2. ඒ. බී. අන්තිම කැමති පත්‍රයක් ලියා අත්සන් කළේ නැත/ එකී ඒ. බී. ගේ අන්තිම කැමති පත්‍රයක් සොයා ගැනීමට නැත.

3. පෙත්සම්කරුගේ උපරිම දැනුම අනුව මියගිය එකී ඒ. බී. ගේ උරුමක්කාරයෝ නම් .............................

4. මියගිය තැනැත්තා තබා ගිය දේපළ පිළිබඳ පෙත්සම්කරුට දැනගත හැකිතාක් සම්පූර්ණ හා සත්‍ය විස්තර මීට යාකොට ඇති උපලේඛනයේ අන්තර්ගත කොට තිබේ.

5. පෙත්සම්කරු (ණයහිමියා ආදී වශයෙන්) හිමිකම් පායි.

එකී අන්තිම කැමති පත්‍රයක් නොමැති බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා (ණයහිමියා ආදී වශයෙන්) පෙත්සම්කරුට හිමිකමක් ඇති බවට ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් කරන ලෙස ද, ඒ අනුව එකී බූදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර හෝ උරුමය පිළිබඳ සහතික නිකුත් කරන ලෙස විධාන කරන ලෙස ද පෙත්සම්කරු යටහත් භාවයෙන් ආයාචනය කරයි. (සීමිත ප්‍රදානයක් ඉල්ලුම් කරන්නේ නම් ඊට සුදුසු ආකාරයක් දක්වන්න.)

(විධිමත් අවසානය)

**උපලේඛනය**

(2 හා 5 වන ඡේද දිවුරුම් පත්‍රයකින් හෝ වාචික සාක්ෂිවලින් සනාථ කරන්න.)

මියගිය තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත දී මියගියේ නම්, අධිකරණයට තනි අධිකරණ බලය තබා ගැනීම සඳහා ඉල්ලුම්කරු විසින් ආඥාවක් ලබාගෙන ඇති බව සඳහන් කරන්න.".

(3) 84 වන ආකෘති පත්‍රය වෙනුවට පහත දැක්වෙන ආකෘති පත්‍රය ආදේශ කිරීමෙන් :—

"අංක 84

(529 (2) වන වගන්තිය)

ප්‍රොබේට් නිලධරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු දැන්වීමේ ආකෘතිය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ ..............................වන වගන්තිය යටතේ වූ දැන්වීම.

මේ උපලේඛනයේ විස්තර කර ඇති මියගිය තැනැත්තන්ගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීමට/ප්‍රොබේට් බලපත්‍රය/අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය/උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා පහත දැක්වෙන ඉල්ලුම් ඉදිරිපත් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කළේ යයි ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් සිදු කිරීමට හෝ අන්තිම කැමති පත්‍රයක් අමුණා හෝ එසේ නොමැතිව ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය කිරීමට හෝ පෙත්සමේ නම් කර ඇති තැනැත්තාට උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීමට විරෝධතා ඇති යම් තැනැත්තකු විසින් එම විරෝධතා ලිඛිතව දිව්රුම් පෙත්සමක් මගින් සනාථ කර පහත දැක්වෙන අදාළ දිසා අධිකරණය විසින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පෙර ගොනු කරනු ලැබිය යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| .................. දිසා අධිකරණය<br><br>විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 20..... මස..... දින | | | |
| උපලේඛනය | | | |
| I තීරය | II තීරය | III තීරය | IV තීරය |
| දිසා අධිකරණ ලියාපදිංචි කිරීමේ අංකය | මියගිය තැනැත්තාගේ නම සහ ලිපිනය | මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇද්ද | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය |
| | | | |

…………………
ප්‍රොබේට් නිලධරයාගේ අත්සන

දිනය : ……………

……………දිසා අධිකරණය".

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.